**කල්මුණේ මහානගර සභාව - 2023**

---------------------------------------

## 1. මූල්‍ය ප්‍රකාශන

### 1.1 තත්ත්වාගණනය කළ මතය

කල්මුණේ මහානගර සභාවේ 2023 දෙසැම්බර් 31 දිනට ශේෂ පත්‍රය, එදිනෙන් අවසන් වර්ෂය සඳහා වූ ආදායම් හා වියදම් ගිණුම, මුදල් ප්‍රවාහ ප්‍රකාශනය සහ ප්‍රමාණාත්මක ගිණුම්කරණ ප්‍රතිපත්තිවලට අදාළ තොරතුරු ද ඇතුළත් මූල්‍ය ප්‍රකාශනවලට අදාළ සටහන්වලින් සමන්විත 2023 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන, මහා නගර සභා ආඥා පනතේ (252 අධිකාරය) 219 වගන්තිය සහ 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ විධිවිධාන සමඟ සංයෝජිතව කියවිය යුතු ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(1) ව්‍යවස්ථාවේ ඇතුළත් විධිවිධාන ප්‍රකාර මාගේ විධානය යටතේ විගණනය කරන ලදි. පාර්ලිමේන්තුව වෙත ඉදිරිපත් කළ යුතු යැයි මා අදහස් කරන මාගේ අදහස් දැක්වීම් හා නිරීක්ෂණයන් මෙම වාර්තාවේ දැක්වේ.

මෙම වාර්තාවේ 1.6 ඡේදයේ දක්වා ඇති කරුණුවලින් වන බලපෑම හැර, මූල්‍ය ප්‍රකාශනවලින් 2023 දෙසැම්බර් 31 දිනට කල්මුණේ මහානගර සභාවේ මූල්‍ය තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා එහි මූල්‍ය ක්‍රියාකාරීත්වය හා මුදල් ප්‍රවාහ පොදුවේ පිළිගත් ගිණුම්කරණ පරිචයන්ට අනුකූලව සත්‍ය හා සාධාරණ තත්ත්වයක් පිළිබිඹු කරන බව මා දරන්නා වූ මතය වේ.

### 1.2 තත්ත්වාගණනය කළ මතය සඳහා පදනම

මෙම වාර්තාවේ 1.6 ඡේදයේ දක්වා ඇති කරුණු මත පදනම්ව මා මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් තත්ත්වාගණනය කළ මතයක් පළකරනු ලැබේ.

ශ්‍රී ලංකා විගණන ප්‍රමිතිවලට (ශ්‍රී.ලං.වි.ප්‍ර.) අනුකූලව මා විගණනය සිදු කරන ලදි. මෙම විගණන ප්‍රමිති යටතේ වූ මාගේ වගකීම, මෙම වාර්තාවේ මූල්‍ය ප්‍රකාශන විගණනය සම්බන්ධයෙන් විගණකගේ වගකීම යන කොටසේ තවදුරටත් විස්තර කර ඇත. මාගේ තත්ත්වාගණනය කළ මතය සඳහා පදනමක් සැපයීම උදෙසා මා විසින් ලබාගෙන ඇති විගණන සාක්ෂි ප්‍රමාණවත් සහ උචිත බව මාගේ විශ්වාසයයි.

### 1.3 මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් කළමනාකරණයේ සහ ඊට සම්බන්ධ පාලනය කරන පාශර්වයන්ගේ වගකීම්

මෙම මූල්‍ය ප්‍රකාශන පොදුවේ පිළිගත් ගිණුම්කරණ පරිචයන්ට අනුකූලව පිළියෙල කිරීම හා සාධාරණ ලෙස ඉදිරිපත් කිරීම සහ වංචා හෝ වැරදි හේතුවෙන් ඇති විය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් තොර වූ මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකි වනු පිණිස අවශ්‍යවන අභ්‍යන්තර පාලනය තීරණය කිරීම කළමනාකරණයේ වගකීම වේ.

මහා නගර සභාවේ මූල්‍ය වාර්ථාකරණ ක්‍රියාවලිය සම්බන්ධ වගකීම, පාලනය කරන පාර්ශවයන් විසින් දරනු ලබයි.

2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 16(1) උප වගන්තිය ප්‍රකාරව මහා නගර සභාවේ වාර්ෂික හා කාලීන මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවන පරිදි ස්වකීය ආදායම්, වියදම්, වත්කම් හා බැරකම් පිළිබඳ නිසි පරිදි පොත්පත් හා වාර්තා පවත්වාගෙන යා යුතුය

## 1.4 විගණන විෂය පථය (මූල්‍ය ප්‍රකාශන විගණනය සම්බන්ධයෙන් විගණකගේ වගකීම)

සමස්තයක් ලෙස මූල්‍ය ප්‍රකාශන, වංචා සහ වැරදි නිසා ඇතිවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් තොර බවට සාධාරණ තහවුරුවක් ලබාදීම සහ මාගේ මතය ඇතුළත් විගණන වාර්තාව නිකුත් කිරීම මාගේ අරමුණ වේ. සාධාරණ සහතිකවීම උසස් මට්ටමේ සහතිකවීමක් වන නමුත්, ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනය සිදු කිරීමේදී එය සැමවිටම ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් අනාවරණය කරගන්නා බවට වන තහවුරු කිරීමක් නොවනු ඇත. වංචා සහ වැරදි තනි හෝ සාමූහික ලෙස බලපෑම නිසා ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් ඇතිවිය හැකි අතර, එහි ප්‍රමාණාත්මක භාවය මෙම මූල්‍ය ප්‍රකාශන පදනම් කරගනිමින් පරිශීලකයන් විසින් ගනු ලබන ආර්ථික තීරණ කෙරෙහි වන බලපෑම මත රඳා පවතී.

ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනයේ කොටසක් ලෙස මා විසින් විගණනයේදී වෘත්තීය විනිශ්වය සහ වෘත්තීය සැකමුසුබවින් යුතුව ක්‍රියා කරන ලදී. මා විසින් තවදුරටත්,

- ප්‍රකාශ කරන ලද විගණන මතයට පදනමක් සපයා ගැනීමේදී වංචා හෝ වැරදි හේතුවෙන් මූල්‍ය ප්‍රකාශනවල ඇති විය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් ඇතිවීමේ අවදානම් හඳුනාගැනීම හා තක්සේරු කිරීම සඳහා අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලැසුම් කර ක්‍රියාත්මක කරන ලදී. වරදවා දැක්වීම හේතුවෙන් සිදුවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් සිදුවන බලපෑමට වඩා වංචාවකින් සිදුවන්නා වූ බලපෑම ප්‍රබල වන්නේ ඒවා දූස්සන්ධානයෙන්, ව්‍යාජ ලේඛන සැකසීමෙන් , චේතනාන්විත මඟහැරීමෙන්, වරදවා දැක්වීමෙන් හෝ අභ්‍යන්තර පාලනයන් මඟ හැරීමෙන් වැනි හේතු නිසා වන බැවිනි.

- අභ්‍යන්තර පාලනයේ සඵලදායිත්වය පිළිබඳව මතයක් ප්‍රකාශ කිරීමේ අදහසින් නොවුවද ,අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලසුම් කිරීම පිණිස අභ්‍යන්තර පාලනය පිළිබඳව අවබෝධයක් ලබාගන්නා ලදී.

- භාවිතා කරන ලද ගිණුම්කරණ ප්‍රතිපත්තිවල උචිතභාවය ,ගිණුම්කරන ඇස්තමේන්තුවල සාධාරණත්වය සහ කළමනාකරණය විසින් කරන ලද සම්බන්ධිත හෙළිදරව් කිරීම් අගයන ලදී.

- මූල්‍ය ප්‍රකාශනවල ව්‍යුහය හා අන්තර්ගතය සඳහා පාදක වූ ගනුදෙනු හා සිද්ධීන් උචිත හා සාධාරණව ඇතුළත් වී ඇති බව සහ හෙළිදරව් කිරීම් ඇතුලත් මූල්‍ය ප්‍රකාශනවල සමස්ථ ඉදිරිපත් කිරීම අගයන ලදී.

හැකිතාක් දුරට හා අවශ්‍ය ඕනෑම විටෙක පහත සඳහන් දෑ පරීක්ෂා කිරීම සඳහා විගණන විෂය පථයද පුළුල් කර ඇත.

- තොරතුරු ඉදිරිපත් කිරීම සම්බන්ධයෙන් බලන කල මහා නගර සභාවේ කාර්යයන් අඛණ්ඩව ඇගයීමට හැකිවන පරිදි එහි සංවිධානය, පද්ධති, පරිපාටි, පොත්පත්, වාර්තා හා වෙනත් ලියකියවිලි විධිමත්ව හා ප්‍රමාණාත්මකව සැලසුම් කර තිබේද යන බව සහ එකී පද්ධති, පරිපාටි, පොත්පත්, වාර්තා හා වෙනත් ලියකියවිලි ඵලදායී ලෙස පවත්වාගෙන යනු ලැබේ ද යන බව;

- අදාළ ලිඛිත නීතියකට හෝ මහා නගර සභාව විසින් නිකුත් කරන ලද වෙනත් පොදු හෝ විශේෂ විධානයකට අනුකූලව, මහා නගර සභාව ක්‍රියා කර ඇති බව,

- සිය බලතල, කර්තව්‍ය සහ කාර්යයන්ට අනුකූලව කටයුතු කර ඇති බව,

- සම්පත් සකසුරුවම් ලෙස, කාර්යක්ෂම ලෙස සහ ඵලදායී ලෙස කාලසීමාවන් තුළ සහ අදාළ නිතීරීතිවලට අනුකූලව ප්‍රසම්පාදනය කර භාවිතා කර ඇති බව.

## 1.5 වෙනත් නෛතික අවශ්‍යතා පිළිබඳ වාතර්ාව

2018 අංක 19 දරන ජාතික විගණන පනතේ පහත සඳහන් අවශ්‍යතාවයන් සම්බන්ධයෙන් විශේෂ ප්‍රතිපාදන ඇතුළත් වේ.

(අ) 2018 අංක 19 දරණ ජාතික විගණන පනතේ 6 (1) (ඈ) (iii) වගන්තියේ සඳහන් අවශ්‍යතාවය අනුව මහානගර සභාවේ මූල්‍ය ප්‍රකාශන ඉකුත් වර්ෂය සමඟ අනුරූප වේ.

(ආ) 2018 අංක 19 දරණ ජාතික විගණන පනතේ 6 (i) (ඈ) (iv) වගන්තියේ සඳහන් අවශ්‍යතාවය අනුව මාගේ වාර්තාවේ තත්ත්වාගණනය කළ මතය සඳහා පදනම ඡේදයේ 1.2(අ) (ii), (iii), (iv), (v), (vi) සහ 1.2(ඇ) (ii) දක්වා ඇති නිරීක්ෂණයන් හැර ඉකුත් වර්ෂයේදී මා විසින් සිදුකරන ලද නිර්දේශයන් ඉදිරිපත් කරන ලද මූල්‍ය ප්‍රකාශනවල ඇතුළත්ව ඇත.

## 1.6 මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීම සම්බන්ධයෙන් වූ විගණන නිරීක්ෂණ

### 1.6.2 නොසැසඳූ පාලන ගිණුම්

| **විගණන නිරීක්ෂණය** | **සභාවේ අදහස් දැක්වීම** | නිර්දේශය |
|---|---|---|
| සමාලෝචිත වර්ෂය අවසානයේ හිඟහිටි බදු ලැයිස්තුවේ ශේෂය සහ මූල්‍ය ප්‍රකාශනයේ දක්වා තිබූ ශේෂය අතර රු.16,509,211ක වෙනසක් නිරීක්ෂණය විය. | නොසැසඳීම් සම්බන්ධයෙන් විශ්වාසනීය තොරතුරු ලද වහාම ඉදිරි මූල්‍ය ප්‍රකාශනවල නිවැරදි කරන බව. | නොසැසඳීම් සඳහා හේතු කඩිනමින් හඳුනාගෙන මූල්‍ය ප්‍රකාශන නිවැරදි කළයුතුය. |

### 1.6.2 විගණනය සඳහා ලිඛිත සාක්ෂි නොවීම

| **විෂයය** | **වටිනාකම** | **ඉදිරිපත් නොකළ සාක්ෂි** | **සභාවේ අදහස් දැක්වීම** | නිර්දේශය |
|---|---|---|---|---|
| | **රු.** | | | |
| ආපසු ගෙවිය යුතු තැන්පතු ශේෂ | 39,993,235 | විස්තරාත්මක වර්ගීකරණ ලැයිස්තුව හා කාල විශ්ලේෂණය | තැන්පතු විශ්ලේෂණය මේ වන විට විගණනයට ඉදිරිපත් කරන බව. | විස්තරාත්මක වර්ගීකරණ විශ්ලේෂණ වාර්තාව හා කාල විශ්ලේෂණය ඉදිරිපත් කිරීමට පියවර ගතයුතුය. |

## 1.7 අනුකූල නොවීම

### 1.7.1 නීති, රීති, රෙගුලාසි හා කළමනාකරණ තීරණවලට අනුකූල නොවීම

| | **නීති, රීති හා රෙගුලාසිවලට යොමුව** | අනුකූල නොවීම් | **සභාවේ අදහස් දැක්වීම** | **නිර්දේශය** |
|---|---|---|---|---|
| (අ) | 2009 අප්‍රේල් 16 දිනැති අංක 09/2009 දරන රාජ්‍ය පරිපාලන චක්‍රලේඛයේ | නිවාඩු දින වැටුප් ගෙවීමේදී ඇඟිලි සලකුණු යන්ත්‍ර සටහන් පදනම් කරමින් පැමිණීම තහවුරු කරගෙන ගෙවීම් සිදුකළ යුතු බව සඳහන් වුවද, එයට | නිලධාරීන්ට ඉහත කරුණ උපදෙසක් ලෙස නිකුත් කර ඇති අතර ඇඟිලි සලකුණු යන්ත්‍ර සටහන් සනාථ කිරීමෙන් පසු නිවාඩු දින | චක්‍රලේඛ ප්‍රකාරව නිවාඩු දින වැටුප් ගෙවිය යුතුය. |

| | | | | |
|---|---|---|---|---|
| | 2 (iv) ඡේදය | අනනුකූලව, ඇඟිලි සලකුණු යන්ත්‍ර භාවිතා කර නොතිබුණු නිලධාරීන්ට එකතුව රු.299,107ක් නිවාඩු දින වැටුප් වශයෙන් ගෙවා තිබුණි. | වැටුප් මේ වන විට ගෙවන බව. | |
| (ආ) | 2021 අගෝස්තු 16 දිනැති අංක **PT/**03/2021 දරන නැගෙනහිර පළාත් චක්‍ර ලේඛය | මුදල්, ගබඩා භාණ්ඩ, රජයේ ආදායම් අයකිරීම් සහ චෙක්පත්වලට අත්සන් තැබීම් ආදි විෂයභාර නිලධාරීන් 10කගෙන් ආරක්ෂිත ඇප තැන්පතු රු.107,500ක් මහානගර සභාව විසින් ලබාගෙන නොතිබුණි. | නිලධාරීන්ගෙන් ඇප මුදල් අයකර ගැනීමට පියවර ගන්නා බව. | චක්‍රලේඛ ප්‍රකාරව නිලධාරීන්ගෙන් ආරක්ෂිත ඇප තැන්පතු ලබාගැනීමට පියවර ගත යුතුය. |

## 2. මූල්‍ය සමාලෝචනය

### 2.1 මූල්‍ය ප්‍රතිඵල

ඉදිරිපත් කරන ලද මූල්‍ය ප්‍රකාශන අනුව 2023 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා සභාවේ පුනරාවර්තන වියදම් ඉක්මවූ ආදායම් රු.57,284,725ක් වූ අතර, ඊට අනුරූපීව ඉකුත් වර්ෂයේ පුනරාවර්තන වියදම ඉක්මවූ ආදායම රු. 59,202,514 ක් විය.

### 2.2 ආදායම් පරිපාලනය

#### 2.2.1 ඇස්තමේන්තුගත ආදායම්, බිල්කළ ආදායම්, රැස්කළ ආදායම් හා හිඟ ආදායම්

සමාලෝචිත වර්ෂයට හා ඉකුත් වර්ෂයට අදාළව සභාව විසින් ඉදිරිපත් කර තිබූ ඇස්තමේන්තුගත ආදායම්, බිල්කල ආදායම්, රැස්කල ආදායම් හා හිඟ ආදායම් පිළිබඳ තොරතුරු පහත දැක්වේ.

| | **2023** | | | | **2022** | | | |
|---|---|---|---|---|---|---|---|---|
| **ආදායම් ප්‍රභවය** | **ඇස්තමේන්තු ගත ආදායම රු.** | **බිල් කළ ආදායම රු.** | **රැස්කළ ආදායම රු.** | **දෙසැම්බර් 31 දිනට හිඟය රු.** | **ඇස්තමේන්තු ගත ආදායම රු.** | **බිල් කළ ආදායම රු.** | **රැස්කළ ආදායම රු.** | **දෙසැම්බර් 31 දිනට හිඟය රු.** |
| වරිපනම් හා බදු | 198,100,000 | 249,180,580 | 20,905,649 | 228,274,930 | 51,730,000 | 168,405,120 | 25,401,677 | 143,003,442 |
| කුලී | 35,325,000 | 85,384,959 | 23,774,376 | 61,610,583 | 24,754,000 | 81,586,027 | 26,982,674 | 54,603,353 |
| බලපත්‍ර ගාස්තු | 19,972,500 | 8,416,456 | 8,416,456 | - | 28,310,000 | 8,283,618 | 8,283,618 | - |
| වෙනත් ආදායම් | 18,170,000 | 11,121,953 | 11,121,953 | -- | 67,765,000 | 14,483,818 | 14,483,818 | - |
| **එකතුව** | **271,567,500** | **354,103,948** | **64,218,434** | **289,885,513** | **172,559,000** | **272,758,584** | **75,151,789** | **197,606,795** |

### 2.2.2 ආදායම් රැස්කිරීමේ කාර්යසාධනය

| | විගණන නිරීක්ෂණය | සභාවේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| (අ) | සභාව විසින් 2012 වර්ෂයේ ඇස්තමේන්තුව පදනම් කරමින් වරිපනම් බදු අයකිරීම හේතුවෙන් සභාවට ආදායම් අහිමි වී තිබූ අතර සමාලෝචිත වර්ෂයේ හා පසුගිය වර්ෂයේ හිඟහිටි මුදල්ද ඇතුළුව රු.11,893,423ක් පමණක් අයකර තිබුණි. | ඉදිරියේදී මෙය නිවැරදි කිරීමට පියවර ගන්නා බව. | අයකළ යුතු හිඟ ආදායම් කඩිනමින් අයකිරීමට පියවර ගත යුතුය. |
| (ආ) | මහානගර සභාවට අයත් කඩකාමර 435ක් පසුගිය වර්ෂ 10කට අධික කාලයක් ලංසු කැඳවා කුලියට ලබාදීමට පියවර ගෙන නොතිබූ අතර විදුලිය හා ජල ගාස්තු පිළිබඳවද ගිවිසුමෙහි සඳහන් කර නොතිබුණි. | මෙම කරුණට ප්‍රමුඛතාවය ලබාදී පියවර ගැනීමට නියමිත බව. | නියමිත පරිදි ලංසු කැඳවා ගිවිසුම්ගත වී කඩකාමර කුලියට දීමට පියවර ගතයුතුය. |
| (ඇ) | 2021 වර්ෂයේ කල්මුණේ පොදු වෙළෙඳපොල සහ මාළු වෙළෙඳපොල බදුදීමෙන් බදු ලබාගත් පුද්ගලයෙකු විසින් සමුපකාර ග්‍රාමීය බැංකුවෙන් රු.5,600,000ක ඇප සුරක්ෂණයක් ඉදිරිපත් කර තිබුණි. මෙම ඇප සුරක්ෂණය ව්‍යාජ ලෙස සකස් කර තිබුණේ වුවද, එය සභාව විසින් පරික්ෂා නොකර පිළිගැනීම නිසා 2024 සැප්තැම්බර් 13 දින දක්වා රු.4,770,100ක් අයනොකර හිඟහිටිව පැවැති නමුත් මේ පිළිබඳව කිසිදු නීතිමය ක්‍රියාමාර්ගයක් ගෙන නොතිබුණි. | මෙම දෝෂය නිවැරදි කිරීමට විධිමත් ක්‍රියාමාර්ග ගෙන ඇති බව. | ආදායම් හිඟ හිටි සියළු පාර්ශවවලින් අයකර ගැනීමට පියවර ගත යුතුය. |
| (ඈ) | මහානගර සභා ආඥාපනතේ 145(1) හා (2) වගන්ති ප්‍රකාරව, අනුමැතිය නොලත් පෞද්ගලික මස්කඩ තහනම් කිරීමට නීතිමය ක්‍රියාමාර්ග ගෙන නොතිබූ අතර, මධ්‍යම පරිසර අධිකාරියේ පාරිසරික බලපත්‍රය රහිතවත්, භාහිර පාර්ශවයක් විසින් ඝාතකාගාරයක් පවත්වා තිබුණි. තවද සාඉන්දිමරුදූ, නට්පිට්මුනෙයි සහ මරුදමුනෙයි ආදි ප්‍රදේශවල ඝාතනය කෙරෙන සතුන් සම්බන්ධයෙන් සභාවට සහ පෞද්ගලික මස්කඩහිමියන් අතර ගිවිසුම් අත්සන් නොකිරීමෙන් 2021 සිට 2023 දක්වා කාලපරිච්ඡේදය තුළ රැස්කර තිබූ රු.12,797,000ක් ආදායම් සනාථ කළ නොහැකි වී තිබුණි. | වර්තමානයේ එම සත්ව ඝාතකාගාරයට පාරිසරික බලපත්‍ර ලබාගෙන සභාවේ අනුමැතිය සඳහා අයදුම් කර ඇත. ඉදිරි වර්ෂයේ සිට විධිමත් ක්‍රියාවලියක් අනුගමනය කිරීමට පියවර ගන්නා බව. | නියමිත අනුමැතින් ලබා සත්ව ඝාතකාගාර පවත්වාගෙන යා යුතු අතර ඝාතනය කෙරෙන ගවයින් පිළිබඳ තොරතුරු නිසි පරිදි පවත්වාගෙන යායුතුය. |
| (ඉ) | මහානගර සභාවට ලබාගත හැකි තොරතුරු මත, මුද්දර ගාස්තු පිළිබඳව 2016 සිට 2021 දක්වා | මුද්දර ගාස්තු පිළිබඳව පැවැති වෙනස් වූ වටිනාකම් | විචලනයන් සඳහා හේතු හඳුනාගෙන |

| | | |
|---|---|---|
| කාලපරිච්ඡේදයේ මහානගර සභාව විසින් යවනු ලැබූ වට්නාකම සහ නැගෙනහිර පළාත් පාලන දෙපාර්තමේන්තුව විසින් යැවූ වට්නාකම අතර රු.6,450,674ක විචලනයක් පැවැති අතර එම විචලනයන් සඳහා හේතු හඳුනාගෙන ආදායම් ලබාගැනීමට කඩිනමින් ක්‍රියාමාර්ග ගෙන නොතිබුණි. | සම්බන්ධයෙන් 2024 සැප්තැම්බර් දින ලිපියක් මගින් ඉල්ලීම් කර ඇති බව. | කඩිනමින් අයකර ගැනීමට පියවර ගත යුතුය. |

**3. මෙහෙයුම් සමාලෝචනය**

**3.1 හඳුනාගත් පාඩු**

| **විගණන නිරීක්ෂණය** | සභාවේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| මහානගර සභාව විසින් ආදායම් රැස්කිරීම සඳහා 2020 ජනවාරි 01 දින සිට භාවිතා කර තිබූ පරිගනකගත මෘදුකාංගය අනුමත ආයතනයකින් මිලදී ගෙන නොතිබූ අතර, වගකිව යුතු සුදුසු නිලධාරීන් නොයෙදවීම, ලේඛන පවත්වාගෙන නොයෑම, විධිමත් සුපරීක්ෂාවක් නොමැතිවීම, උසස් නිලධාරීන් විසින් සහතික නොකිරීම, අභ්‍යන්තර පාලනය සහ අභ්‍යන්තර විගණනයක් සිදු නොවීම වැනි හේතූන් නිසා දෛනිකව අයකළ ආදායම් සම්පූර්ණයෙන් මහානගර සභාවේ ගිණුම්වලට තැන්පත් නොවී පැවැති අතර, මේ පිළිබඳව නැගෙනහිර පළාත් අභ්‍යන්තර විගණන ඒකකය විසින් සිදුකළ පරීක්ෂාවේදී ආදායම් මූලාශ්‍ර 09කින් අයකර තිබූ රු.18,094,795ක් පමණ වූ මුදලක් තැන්පත් නොකර වංචා කර තිබුණි. මේ පිළිබඳව ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ මුදල් රෙගුලාසි 101 සිට 110 දක්වා විධිවිධාන ප්‍රකාරව ක්‍රියාමාර්ග ගැනීම සම්බන්ධ ලිපි ලේඛන විගණනයට ඉදිරිපත් කර නොතිබුණි. | මූල්‍ය අංශයේ සිදු වූ මූල්‍ය වංචාව සම්බන්ධයෙන් කල්මුණේ මහේස්ත්‍රාත් අධිකරණයේ නඩුවක් විභාග වෙමින් පවතී. මෙම නඩුව අවසන් වූ පසුව මේ පිළිබඳ තොරතුරු ඔබ වෙත දැනුම් දෙනු ලබන බව. | එම මෘදුකාංගය අනුමත ආයතනයකින් මිලදී ගෙන, වගකිව යුතු සුදුසුකම්ලත් නිලධාරීන් යොදවා, විධිමත්ව ලේඛන පවත්වා ගතයුතු අතර, වංචාවට ඉඩ ප්‍රස්ථා සැලසූ පාර්ශවයන්ට විනය ක්‍රියාමාර්ග ගෙන මෙම පාඩුව ඔවුන්ගෙන් අයකර ගැනීමට පියවර ගතයුතුය. |

**3.2 වත්කම් කළමනාකරණය**

| | **විගණන නිරීක්ෂණය** | **සභාවේ අදහස් දැක්වීම** | **නිර්දේශය** |
|---|---|---|---|
| (අ) | මහානගර සභාවේ භාවිතයේ පවතින වාහන 05ක් දීර්ඝකාලයක් පුද්ගලික වාහන අළුත්වැඩියා ගරාජයන්හි නවතා තබා තිබූ නමුත්, ඒවා අළුත්වැඩියා කර නැවත භාවිතා කිරීමට 2024 ඔක්තෝබර් 07 විගණන දින වන විටත් පියවර ගෙන නොතිබුණි. | මේ සම්බන්ධයෙන් වර්තමානයේ කමිටුවක් ස්ථාපිත කර අළුත්වැඩියාට සහ අපහරණය කිරීමටත් කටයුතු කරමින් පවතින බව. | අළුත්වැඩියා කර නැවත භාවිතා කිරීමට හෝ අපහරණය කිරීමට හෝ පියවර ගතයුතුය. |
| (ආ) | මහානගර සභාවේ භාවිතයේ පවතින වෙනත් ආයතනවල නමින් පවතින වාහන 13ක අයිතිය මහානගර සභාවේ නමට පවරා ගැනීමට වර්ෂ 05කට අධික කාලයක සිට පියවර ගෙන නොතිබුණි. | ඉදිරිකාලයේදී පවරා ගැනීමට ක්‍රියාමාර්ග ගනු ලබන බව. | වාහනවල හිමිකාරිත්වය මාරුකර ගැනීමට පියවර ගතයුතුය. |

**3.3** මානව සම්පත් කළමනාකරණය

| විගණන නිරීක්ෂණය | සභාවේ අදහස් දැක්වීම | නිදේර්ශය |
|---|---|---|
| මියගිය, විශ්‍රාම ගිය සහ සේවයෙන් ඉවත්ව ගිය සභාවේ නිලධාරින් 03කගෙන් අයවිය යුතු එකතුව රු.192,650ක හිඟණය එම පුද්ගලයින්ගෙන් හෝ ඇපකරුවන්ගෙන් අයකර ගැනීමට පියවර ගෙන නොතිබුණි. | මියගිය නිලධාරියාගේ හිඟණය පාරිතෝෂිතයෙන්ද, අනෙකුත් නිලධාරින්ගේ හිඟණය ඔවුන්ගෙන් හෝ ඇපකරුවන්ගෙන් අයකර ගැනීමට පියවර ගන්නා බව. | හිඟණය එම පුද්ගලයින්ගෙන් හෝ ඇපකරුවන්ගෙන් අයකර ගැනීමට පියවර ගතයුතුය. |